(27

## අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය

### 01. හැඳින්වීම

අංක 2310/29 හා 2022.12.14 දිනැති (අති විශෙෂ) ගැසට් පත්‍රයේ පළ කර ඇති, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩය හි XVIII පරිච්ඡේදයේ 251 වගන්තිය අනුව රාජ්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධව විධිවිධානවලට යටත්ව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ.

### 02. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර

#### 2.1 අදාළ නිලධාරීන්

ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් කම්කරු හා මුරකරු ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාළ වේ.

#### 2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කළ යුතු සේවා කාලය

2.2.1 වර්තමාන සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

2.2.2 එකම සේවා ස්ථානයක වසර 05කට වැඩි සේවා කාලයක් සපුරා ඇති නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

#### 2.3 සේවා කාලය ගණනය කිරීම

I. වාර්ෂික ස්ථාන මාරු වලදී කාල ගණනය කරනු ලබන්නේ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනටය. (උදා - 2025 වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා 2024.12.31 දිනය.)

II. සේවා කාලයන් ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ අදාළ සේවා ස්ථානයේ සේවයට වාර්තා කල දින සිටය. නිලධරයාගේ පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සඳහා ගණන් ගනු නොලැබේ.

#### 2.4 ක්‍රමවේදය හා අනෙකුත් කරුණු

I. වාර්ෂික ස්ථාන මාරු පටිපාටියෙහි 2.2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයෙකු වෙනත් ස්ථානයකට මාරු වීමට ඉල්ලා ඇති විටක එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැකිය.

II. යම් සේවා ස්ථානයක ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතරින් වැඩිම සේවා කාලයක් සපුරා ඇති නිලධරයන් (අනෙකුත් කොන්දේසි වලට යටත්ව) එම සේවා ස්ථානයට ස්ථාන මාරු කරනු ලැබේ.

III. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේදී දෙපාර්තමේන්තු වල සේවා අවශ්‍යතාවයන්ද කාර්යාලවල කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමටද සෑමවිටම උත්සහ කළ යුතු වේ.



ad

(27)b

**2.5 වාර්ෂික ස්ථාන මාරුවීම් වලට යටත් නොවන නිලධාරීන්**

වයස අවුරුදු 53 ඉක්මවූ නිලධාරීන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

**03. <u>වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 250. III හා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2024 හි විධිවිධාන අනුව විය යුතුය.

**04. <u>වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින් හි 254(II) හි විධිවිධාන අනුව පත් කෙරේ.

**05. <u>වාර්ෂික ස්ථාන මාරු කාල සටහන</u>**

| | කාරණය | දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම. | ජූනි මස 01 වන දිනට පෙර |
| 02 | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීම පිළිබඳව දැන්වීම් නිකුත් කිරීම. | ජූනි මස 30 වන දිනට පෙර |
| 03 | සම්පූර්ණ කරන ලද වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම. | ජූලි මස 31 වන දිනට පෙර |
| 04 | අදාළ බලධාරියා විසින් අයදුම්පත්‍ර ස්ථානමාරු කමිටුවට භාර දීම. | අගෝස්තු මස 10 වන දිනට පෙර |
| 05 | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධරයා වෙත ලිඛිතව භාර දීම. | අගෝස්තු මස 31 වන දිනට පෙර |
| 06 | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම. | සැප්තැම්බර් මස 15 වන දිනට පෙර |
| 07 | ස්ථාන මාරු වීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීම. | සැප්තැම්බර් මස 30 වන දිනට පෙර |
| 08 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධරයා වෙත ලිඛිතව භාර දීම. | ඔක්තෝම්බර් මස 15 වන දිනට පෙර |
| 09 | අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම. | නොවැම්බර් මස 01 වන දිනට පෙර |
| 10 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීමේ අවසන් දිනය | නොවැම්බර් මස 15 වන දිනට පෙර |
| 11 | වාර්ෂික ස්ථාන මාරු බලාත්මක කිරීම. | ජනවාරි මස 01 දින සිට |

**06. <u>වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර</u>**

i. වාර්ෂික ස්ථාන මාරු කිරීමක් පිළිබඳව බලය අභිනියෝජිත බලධරයා විසින් දෙන ලද නියෝගයකින් අතෘප්තියට පත් වූ කිසියම් නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති I වැනි කාණ්ඩයේ පරිශිෂ්ඨ 16 අනුව පමණක් සියළුම අදාළ තහවුරු කිරීමේ ලියවිලිවල සහතික කළ පිටපත් ද සමග ඉදිරිපත් කළ යුතු වන්නේය.



m

CamScanner

ii. නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, ආයතන ප්‍රධානියා, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා මගින් පමණක් වන්නේය.

iii. එසේ වුව ද, එකී අභියාචනයේ ප්‍රගමන පිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත සෘජුවම යොමු කිරීමට එම රජයේ නිලධරයාට හැකියාව ඇත්තේය.

iv. වාර්ෂික ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් එම ස්ථාන මාරු කිරීමේ නියෝගය ප්‍රසිද්ධියට පත් කරන ලද දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේය.නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

v. කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනයට අදාළ සියළු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද අභියාචනය පිළිබඳ ස්වකීය නිරීක්ෂණ හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ පරිශිෂ්ඨ 16 හා 17 ද සමග නිර්දේශ සහිත එම අභියාචනය නියමිත දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානියා, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා කටයුතු කළ යුතු වන්නේය.

vi. එවැනි අභියාචනයක් ලැබී දින 15ක් ඇතුළත ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කරනු ලබන්නේය.

vii. වාර්ෂික ස්ථාන මාරු නියෝග අනුව නියමිත දිනයේ දී නව සේවා ස්ථානයට ස්ථාන මාරු නොවන ස්ථාන මාරු නියෝග නොපිළිපැදීම සම්බන්ධයෙන් නිලධාරීන්ගේ වැටුප් අත්හිටුවීමට කටයුතු කරනු ලබන අතර, එම නිලධාරියාට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

viii. ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි විෂය භාර අමාත්‍යාංශ ලේකම් හා ආයතන ප්‍රධාන වෙත යවනු ලබන්නේය.

ix. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත් වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාර පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම ඇත්තේය.

| | |
|---|---|
| සකස් කලේ : | පරීක්ෂා කලේ : |
| අත්සන ................................ | අත්සන ................................ |
| (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා) |
| එම්.ඩී.එන්.එන්.මාපා<br>පරිපාලන නිලධාරී<br>ආයතන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට | එම්.ඩී.ඩබ්ලිව්.ඩී. පල්ලාවල<br>අධ්‍යක්ෂ (පාලන)<br>අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට,<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| නම : ................................ | නම : ................................ |
| තනතුර : ................................ | තනතුර : ................................ |
| දිනය : 2026/05/26 | දිනය : 2026/5/26. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ............................ 2026/06/05

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ....................................

තනතුර : ....එම්.කේ.එස්.ආර්.ඩී. සමරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

නිල මුද්‍රාව : අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත
පේරාදෙණිය

දිනය : ....................................

යොමු අංකය MOA/Ad/EA/04/42

දිනැතිව 2026/04/23 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා තනතුර/තනතුරු සඳහා ස්ථාන මාරු පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන ....................................

නම ....................................

.................................... අමාත්‍යංශය

දිනය 2026.07.02

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රාජගිරිය පාර, බත්තරමුල්ල

නිල මුද්‍රාව ....................................

යොමු අංකය PSC/EST/07-04/02/2025

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙහි ප්‍රාථමික ශිල්පීය සේවා තනතුර/තනතුරු සඳහා යෝජිත මෙම ස්ථාන මාරු පටිපාටිය 2026-04-23 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන ....................................

නම ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය 2026/9/14

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල

නිල මුද්‍රාව ....................................